


**ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම (AASL) වන අප විශිෂ්ටත්වය සඳහා විශිෂ්ටයින් බඳවා ගන්නා සහ සියලු දෙනාට සමාන රැකියා අවස්ථා ලබාදෙන සේවායෝජකයෙක් වන්නෙමු.**

**මෙම සමාගමේ කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපල රත්මලාන, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල සහ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපල වල පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා මෙහි දක්වා ඇති සුදුසුකම් හා සේවා පළපුරුද්ද සපුරා ඇති පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## වෛද්‍ය උපස්ථායක I වන ශ්‍රේණිය තනතුර
## වෛද්‍ය උපස්ථායිකා I වන ශ්‍රේණිය තනතුර

**1. රැකියාවේ ස්වභාවය** : ගුවන් තොටුපොල වෛද්‍ය මධ්‍යස්ථානයේ සේවා අරමුණු ඉටු කිරීමට අදාල වෛද්‍ය හා වෛද්‍ය නොවන කාර්යය මණ්ඩලයට සහාය වීම, වෛද්‍ය මධ්‍යස්ථානයට ප්‍රතිකාර සඳහා පැමිණෙන මගීන්ට හා ගුවන් තොටුපොල කාර්යය මණ්ඩලයට උපස්ථාන කිරීම හා කාර්යාල කටයුතු සඳහා සහාය වීම.

**2. රැකියාවේ වගකීම** :

- වෛද්‍ය මධ්‍යස්ථානයේ දෛනික රාජකාරි කටයුතු සඳහා හෙද නිළධාරිනියන්ට සහාය දැක්වීම.
- වෛද්‍ය හා ශෛල්‍ය වෛද්‍ය උපකරණ පිරිසිදු කිරීම සහ ජීවානුහරණය කිරීම.
- සැරහුම් සැකසීම හා ජීවානුහරණය කිරීම.
- අසාධ්‍ය රෝගී මගීන් හා ආයතනයේ රෝගී සේවක සේවිකාවන් ගිලන් රථයෙන් රෝහල් වෙත රැගෙන යාම.
- වෛද්‍ය මධ්‍යස්ථානය සෑම විටම පිරිසිදුව හා පිළිවෙලට තබා ගැනීමට වග බලා ගැනීම.
- ඇඳ ඇතිරිලි මාරු කිරීම, සැකසීම හා ලොන්ඩ්‍රිය වෙත යැවීම.
- වෛද්‍ය මධ්‍යස්ථානයේ ඉන්වෙන්ට්‍රිය පරීක්ෂා කිරීම සඳහා හෙද නිළධාරීන්ට සහාය දැක්වීම.
- වෛද්‍ය මධ්‍යස්ථානයේ වෛද්‍ය හා වෛද්‍ය නොවන සියලුම අවශ්‍යතා සඳහා, රාජකාරි වෛද්‍යතුමන්, හෙද නිලධාරීන්ගේ කාර්යාලිය කටයුතු හා ආයතනයේ ප්‍රධාන වෛද්‍ය නිළධාරීතුමාගේ රාජකාරි කටයුතු සඳහා සහාය දැක්වීම.
- අවශ්‍ය විටෙක ආයතනයේ ප්‍රධාන වෛද්‍ය නිළධාරීතුමා විසින් පවරන ලබන අනෙකුත් වගකීම් ඉටු කිරීම.

**3. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්** : 1. ඉංග්‍රීසි භාෂාව සහ විද්‍යාව හෝ සෞඛ්‍යය අධ්‍යාපනය යන විෂයයන් ඇතුලත්ව අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් 6ක් සමත් විය යුතුය.

**සහ**

2. පිළිගත් ආයතනයකින් වලංගු ප්‍රථමාධාර සහතිකයක් (CPR Certificate) ලබා තිබිය යුතුය.

**සහ**

3. අදාල ක්ෂේත්‍රයෙන් අවම වශයෙන් වසර හතර (04) ක සේවා පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

**4. වයස** අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට වයස අවුරුදු 35ට අඩුවිය යුතුය.

**5. තෝරා ගැනීමේ ක්‍රමය** : ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**6. වැටුප** : තෝරා ගනු ලබන්නන් හට ආකර්ශනීය වැටුපක් සහ අමතර ප්‍රතිලාභ හිමිවේ.

**<u>පොදු කරුණු</u>**

**භාෂා කුසලතාව : ඉංග්‍රීසි සහ සිංහල භාෂාවන් සඳහා මනා ලිඛිත හා වාචික සන්නිවේදන කුසලතාවක් තිබීම අවශ්‍ය වන අතර දෙමළ භාෂාව කතා කිරීමට ඇති හැකියාව අමතර සුදුසුකමක් වේ.**

**යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි (JIA) පවතින පුරප්පාඩු පිරවීම සඳහා උතුරු සහ නැගෙනහිර පළාත්වල අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය ලබාදෙනු ලැබේ.**

**සේවය සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට නවාතැන් සහ ප්‍රවාහන පහසුකම් අප සමාගම විසින් සපයනු නොලැබේ.**

ඉහත තනතුර සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් සමාගමට අයත් දිවයිනේ පිහිටි ඕනෑම ස්ථානයක සේවය කල යුතුවේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සකස් කළ අයදුම්පතක් පහත ලිපිනයට **2026 ඔක්තෝබර් මස 01 වන දිනට පෙර** ලැබෙන සේ **ලියාපදිංචි තැපැලෙන් හෝ කුරියර් සේවාව මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කල යුතුවේ.

**සුදුසුකම් සනාථ කිරීමට අදාල සහතික වල ඡායා පිටපත් සමඟ ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අනුමත මාධ්‍ය වලින් හැර වෙනත් මාධ්‍යයන්ගෙන් ඉදිරිපත් කරන අයදුම්පත් සහ අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයෙන් පසුව මෙම කාර්යාලය වෙත ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**මෙම පුරප්පාඩු දැන්වීම අවලංගු කිරීම හෝ නැවත කැඳවීමේ පූර්ණ අයිතිය සමාගම සතු වන අතර තෝරා ගැනීම් ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.**

මෙම දැන්වීමේ සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ පරිවර්තනයන්හි සඳහන් කරුණු පිළිබඳ අපැහැදිලිතාවයක් ඇති වුවහොත් සිංහල දැන්වීමේ සඳහන් කරුණු බලපැවැත්වෙන බව කරුණාවෙන් සලකන්න.

---

**සභාපති**

**ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම**

**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**

**කටුනායක**

**දිනය - 13/09/2026**